(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 392.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2014 සැප්තැම්බර් මස 24 වැනි බදාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2642/'12

1\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) උතුරු හා නැගෙනහිර පළාත්වල කාන්තාවන් විසින් මූලිකත්වය දරනු ලබන පවුල්වලට සුදුසු ආර්ථික ක්‍රියාවලියකට යොමු වීම සඳහා එක් පවුලකට රුපියල් ලක්ෂ 2කට නොවැඩි වූ ණය මුදලක් සහන පොලියක් යටතේ ලබාදීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම ණය මුදල් ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3247/'12

2\.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3701/'13

3\.

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) රජයට බදු ගෙවනු ලබන රාජ්‍ය හා පුද්ගලික ඉන්ධන අලෙවි සමාගම් කවරේද;

(ii) පසුගිය වර්ෂ 10 තුළ එම එක් එක් සමාගම වාර්ෂිකව ගෙවන ලද බදු ප්‍රමාණයන් එක් එක් බදු වර්ගය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බදු ගෙවීමේදී කවර හෝ සමාගමක් සඳහා, කවර හෝ බදු නිදහසක් ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම සමාගම්වල නම් කවරේද;

(v) එවන් බදු සහනයක් ලබාදීමට හේතු කවරේද;

(vi) පසුගිය වර්ෂ දහය තුළ එම බදු සහනය ලබාදීම නිසා ශ්‍රී ලංකා රජය වෙත අහිමි වී ඇති බදු මුදල් ප්‍රමාණය එක් එක් බදු වර්ගය අනුව, වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3963/’13

4\.

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර මහ නගර සභාවේ, ගොහාගොඩ කසළ බැහැර කිරීමට යොදාගන්නා ස්ථානයේ ජනනය වන ක්ෂීරණ මහවැලි ගඟට එක්වන බව දන්නේද;

(ii) ඉහත ස්ථානයෙන් බැහැරවන ක්ෂීරණයේ පී.එච් අගය, විද්‍යුත් සන්නායකතාව, පාරදෘශ්‍යතාවය, උෂ්ණත්වය, තෙල් සහ ග්‍රීස්, ජෛව ඔක්සිජන් ඉල්ලුම (BOD) සහ රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD) යන භෞතික හා රසායනික ලක්ෂණයන්ට අදාළ අගයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ක්ෂීරණයේ අඩංගු ක්‍රෝමියම්, කැඩ්මියම්, ඊයම් සහ රසදිය යන බැර ලෝහවල සහ පොස්පේට් සහ නයිට්‍රේට් යන සංඝටකවල සංයුතිය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගොහාගොඩ කසළගොඩ නිසා මහවැලි ගඟට අඛණ්ඩව එකතුවන බැර ලෝහ සහිත ක්ෂීරණයන් භූගත ජල පද්ධතිය තුළට එකතුවීම හානිකර තත්ත්වයක් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම තත්ත්වය වැළැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4181/’13

5\.

ගරු රෝසි සේනානායක මහත්මිය,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඇහැලියගොඩ - නාපාවල මාර්ගය සහ ඇහැලියගොඩ - පනාවල මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධ නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුමට අනුව,

(i) එම මාර්ග සංවර්ධනය කිරීමට වැයවන උපරිම මුදල කොපමණද;

(ii) එම සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් ඉවත්කළ යුතු නිවාස, වෙළඳසැල් සහ වෙනත් ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) එසේ ඉවත් කරනු ලබන නිවාස, වෙළඳසැල් හා වෙනත් ගොඩනැගිලි වෙනුවෙන් වන්දි ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4625/'13

6.

ගරු සුජීව සේනසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාසල්වල ඉතිහාසය විෂයය ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම දැනට වර්ෂ 1 ½ක පමණ කාලයක සිට නතර කර තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) දරුවන්ට ඉතිහාසය විෂයය ඉගැන්වීම නොවැදගත් කරුණක් ලෙස රජය සලකන්නේද;

(iv) නොඑසේ නම්, පාසල්වල ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉතිහාසය ඉගැන්වීමට නොහැකි වීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4637/'13

7.

ගරු පී. හැරිසන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට කෘෂි බීජ ආනයනය කරනු ලබන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) බීජ ආනයනය කරන ආයතනයකට ඒ සඳහා තිබිය යුතු සුදුසුකම් කවරේද;

(iii) එම ආයතනවල කෘෂි බීජ පිළිබඳ දැනුම ඇති අය අනිවාර්යයෙන් සේවය කිරීමේ අවශ්‍යතාවයක් තිබේද;

(iv) එසේ නම්, ඔවුන්ට තිබිය යුතු සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජය මඟින් බීජ ආනයනය කරනු ලබන ආයතන තිබේද;

(ii) එම ආයතන මඟින් ගෙන්වනු ලබන බීජ වර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එසේ නම්, ඒ ආයතනවල නම් එතුමා සභාගත කරන්නෙහිද?

(ඈ) (i) පෞද්ගලික අංශයේ ආයතන මඟින් ආනයනය කරනු ලබන බීජ පරීක්ෂණයට භාජනය කරනු ලබන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ආයතනයක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

4734/’14

8\.
ගරු අනෝමා ගමගේ මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එක් වර්ෂයක් තුළදී එයට අලුතින් එක්වන විශ්‍රාමිකයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විශ්‍රාම ගන්නා වයස සම්පූර්ණ කිරීමෙන් පසු තම විශ්‍රාම වැටුප ලබාගැනීමට විශ්‍රාමිකයාට ගතවන කාල සීමාව කොපමණද;

(ii) ඒ අනුව විශ්‍රාම වැටුප ලැබීමේදී යම් ප්‍රමාදයක් සිදුවන්නේ නම්, එයට හේතු ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන ඇති කරුණු කවරේද;

(iii) විදේශගත විශ්‍රාමිකයන් මෙන්ම මෙරට විශ්‍රාමිකයන් ජීවතුන් අතර සිටීද යන්න නිශ්චය කර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iv) එම ක්‍රමවේදය තුළින් අවශ්‍ය තොරතුරු නිසි ආකාරයෙන් ලබාගත හැකිවන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2013 වර්ෂයේ විශ්‍රාම ගිය, මෙතෙක් සිය විශ්‍රාම පාරිතෝෂිකය ලබාගැනීමට නොහැකිව සිටින පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ විශ්‍රාම පාරිතෝෂික නොලැබීමට හේතු කවරේද;

(iii) විශ්‍රාම පාරිතෝෂිකය ලැබීම ප්‍රමාදවීම, විශ්‍රාම වැටුප ලබාගැනීම ප්‍රමාදවීමට ද හේතු වී ඇති බව පිළිගන්නේද;

(iv) ඉහත සඳහන් ප්‍රමාදයන් වැලැක්වීමට අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4763/’14

9\.
ගරු අශෝක් අබේසිංහ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා කෘෂි බීජ පැකට් බෙදාහැරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වූයේද;

(ii) එසේ නම්, එම වැඩ සටහන යටතේ බෙදා හරින ලද බීජ පැකට් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iv) එම වැඩ සටහන තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4852/'14

10.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සුළු ව්‍යාපාර පවත්වාගෙන යාම පිණිස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂය සඳහා නිකුත් කර ඇති ලියාපදිංචි සහතික සංඛ්‍යාව කොපමණද;

(ii) එකී එක් එක් ලියාපදිංචි සහතිකය නිකුත් කරන ලද්දේ කවර පුද්ගලයින් වෙතද;

(iii) එකී එක් එක් ලියාපදිංචි සහතිකය නිකුත් කරන ලද නිවැරදි දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4960/'14

11.

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් සභාවේ ධීවර අමාත්‍යාංශය විසින් ධීවරයින් සඳහා බෝට්ටු ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලබන්නේද;

(ii) එම බෝට්ටු ලබාදීමට ධීවරයන් තෝරා ගන්නා ලද පදනම කවරේද;

(iii) එක් එක් බෝට්ටු වර්ගය සඳහා ධීවරයන් වෙත ලබා දෙන සහනාධාරයේ වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ධීවරයන්ට ලබා දෙන එම බෝට්ටු වර්ග සහ ඒවායේ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ධීවර බෝට්ටුවක නිෂ්පාදන පිරිවැය එක් එක් බෝට්ටු වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) වයඹ පළාත් සභාව මගින් 2010 වර්ෂයේ සිට මේ දක්වා ලබාදී ඇති ධීවර බෝට්ටු සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව, වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4963/'14

12.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කළමනාකරණ උපාධි පාඨමාලාව සඳහා බඳවා ගන්නා ශිෂ්‍යයින් සංඛ්‍යාව අඩු කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම උපාධි පාඨමාලාව ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) පාඨමාලාව හැදෑරීම සඳහා එක් වර්ෂයකට බඳවා ගැනීමට තීරණය කර ඇති අභ්‍යන්තර සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) පසුගිය වර්ෂයේ දී කළමනාකරණ උපාධිය සඳහා බඳවා ගත් අභ්‍යන්තර සිසුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5160/’14

13.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පුරවැසියන්ව සිට පසුව වෙනත් රටක පුරවැසිභාවය ලැබීම නිසා ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය අහිමි වූ තැනැත්තන් විසින් ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම්පත් සලකා බැලීමට අදාළව අනුගමනය කරන ප්‍රතිපත්තිය කවරේද;

(ii) එවැනි අයදුම්පත් සලකා බැලීම සම්බන්ධයෙන් ප්‍රමාදයක් පවතින බව දන්නේද;

(iii) ඉහත කී ප්‍රමාදය වලක්වා ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iv) ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම පිණිස ඉදිරිපත් කළ, මෙතෙක් සලකා බලා අවසන් නොකරන ලද අයදුම්පත් සංඛ්‍යාව කොපමණද;

(v) 2010.01.01 දිනෙන් පසු ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5194/’14

14.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2013.07.25 දිනට සී/ස කොළඹ දිස්ත්‍රික්කයේ සමූපකාර ග්‍රාමීය බැංකු සංගමයේ ආශ්‍රිත සාමාජික ණය මුදල්වල ඇති හිඟ වාරිකවල තත්ත්වය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නෙහිද ?

(ආ) (i) හිඟ වාරික 2 ට වැඩි ණය ප්‍රමාණය කොපමණද;

(ii) එම ණය ලබාගත් අයගේ නම් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) සී/ස කොළඹ දිස්ත්‍රික්කයේ සමූපකාර ග්‍රාමීය බැංකු සංගමයට අය වීමට ඇති හිඟ ණය වාරික අය කර ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) සමූපකාර පනත අනුව ග්‍රාමීය බැංකු සංගමයට ණය දීමේ හැකියාව ඇත්තේ සාමාජික බැංකුවලටද; නැතහොත්, පුද්ගලයින්ටද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

ගරු රවි කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008, 2009 සහ 2013 වර්ෂවලදී ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන් සංඛ්‍යාව වාර්ෂික පදනමින් කොපමණද;

(ii) පසුගිය වර්ෂ පහ තුළ එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකාවට සංචාරකයන් පැමිණි රටවල් සහ ඔවුන් දිවයිනෙහි රැඳී සිටි සාමාන්‍ය දින ගණන කවරේද;

(iii) සංචාරක ව්‍යාපාරය තුළින් ඉපයූ ආදායම සහ සංචාරකයන් විසින් වියදම් කළ සාමාන්‍ය පිරිවැය 2008, 2009 සහ 2013 වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ පහ තුළ ඍජුව සහ වක්‍රව සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ වූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද?

(ඇ) (i) රට තුළ තිබෙන හෝටල් කාමර සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත කාමරවලින් සමන්විත වන හෝටල් තරු වර්ගීකරණයට අනුව කවරේද;

යන්න එතුමා තවදුරටත් 2010, 2011 සහ 2012 යන වර්ෂවලට අදාළව සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 3.00 දක්වා විය යුතුය. අ. භා. 2.00 ට ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2014 අගෝස්තු මස 07) [1]

*2.

ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

මහනගර සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

නගර සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජූලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*14.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*17.

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග,—2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 34 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 මැයි 19 දිනැති අංක 1863/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.08.19 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1999 අංක 38 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2013.09.04 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2013.09.13 දින සලකා බලන ලදී.)

*19.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1983 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ 2013.11.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.07 දින සලකා බලන ලදී.)

*20.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 (2) වගන්තිය යටතේ 2013.10.10 දින ඉදිරිපත් කරන ලද 2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*21.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2014.01.21 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.04.24 දින සලකා බලන ලදී.)

*22.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*23.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*24.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනතේ 37(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*25.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*26.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතන පනතේ 36(4) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*27.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව - 2011,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*28.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව - 2011,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරිය පනතේ 34(2) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය

සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*29.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*30.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව - 2011,— 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ 27 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*31.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

32.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

33.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

34.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

35.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

36.

ජයන්තිපුර සුභසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

37.

මෙත් සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

38.

ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

39.

ජයරත්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

40.

ජම් ඉය්යතුස් සහ්වා අල් - හයිරිය්යා (ජස්කා) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

41.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

42.

අනුර විදානගමගේ ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

43.

අල්හසන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

44.

දහම් පාසල් ගුරු අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]
''පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය'' යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---